# දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය - කැලණිය විශ්වවිද්‍යාලය

## ශාස්ත්‍රවේදී උපාධි බාහිර පාඨමාලා සඳහා ප්‍රවේශ නිර්ණායක

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ චක්‍රලේඛ අංක 932 හා 01/2021 අනුව මෙම සංශෝධනය සිදුකරන ලදී. 2017අධ්‍යයන වර්ෂයේ සිට මෙම නිර්ණායකය ක්‍රියාත්මක කිරීමට නියමිතය.**

**1. අවශ්‍ය අවම සුදුසුකම්**

**1.1** ඒ ඒ විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි කර ගන්නා බැවින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) පරීක්ෂණයේ දී ඉහළම ඉසෙඩ් අගය (Z-Score) ලබා ඇති ශිෂ්‍යයන්ට ප්‍රමුඛතාව ලබා දීමේ පදනම මත අපේක්ෂකයින් තෝරාගනු ලැබේ.

**1.2** ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් තෙවතාවකට නොවැඩි වාර ගණනක් තුළ, එක්වරක දී ම කවර හෝ විෂයයන් තුනකින් සමත් වී තිබීම අයදුම් කිරීම සඳහා අවශ්‍ය වේ.

**1.3** ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ රාමුවේ දැක්වෙන යෝග්‍යතා මට්ටම් තුන, විශ්වවිද්‍යාල මට්ටම් එක සඳහා අවශ්‍ය ශ්‍රී ලංකායෝග්‍යතා මට්ටම් දෙකට අදාළ (SLQF Level-2) සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් (NVQ Level - 5, Advance Certificate)

**1.4** 2016 අධ්‍යයන වර්ෂයේ සිට ඒ ඒ අධ්‍යයන වර්ෂවලට අදාළව බාහිර විභාග පාඨමාලා සඳහා ප්‍රවේශ කමිටුවේ නිර්දේශ මත සනාතන සභාව අනුමත කළ වෙනත් සුදුසුකම්.

**1.5** **1.3** හා **1.4** යටතේ සඳහන් තෝරා ගැනීම් සිදු කරනු ලබන්නේ **1.1** යටතේ තෝරා ගැනීම් වලින් පසුව හා විශේෂ අවස්ථාවල දී සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් පමණි.

**2. ප්‍රවේශය සඳහා යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව**

| අධ්‍යයන වර්ෂය | අභ්‍යන්තර ශිෂ්‍ය සංඛ්‍යාව | බාහිරව බඳවා ගත යුතු ශිෂ්‍ය සංඛ්‍යාව අභ්‍යන්තර මෙන් දෙගුණයකි | |
|---|---|---|---|
| 2016/2017 | 1460 | 1460×2 | 2920 |
| 2017/2018 | 1401 | 1401×2 | 2802 |
| 2018/2019 | 1433 | 1433×2 | 2866 |
| **මුළු එකතුව** | **4294** | | **8588** |

ඉදිරි අධ්‍යයන වර්ෂ සඳහා උපාධි පාඨමාලාවට ඇතුළත් වන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව විශ්වවිද්‍යාලයේ අනුරූප අභ්‍යන්තර වැඩ සටහනට ඇතුළත් කර ගන්නා ශිෂ්‍ය සංඛ්‍යාව මෙන් දෙගුණයක් වනු ඇත.

**3. ප්‍රවේශය සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය**

සෑම අධ්‍යයන වර්ෂයක් සඳහා ම දැනට හා ඉදිරියට සිසුන් තෝරා ගැනීම පහත සඳහන් ක්‍රමවේදයට අනුව වෙන් වෙන් වශයෙන් සිදුකරනු ලැබේ.

| | | |
|---|---|---|
| **3.1** | අයදුම්පත් කැඳවන අධ්‍යයන වර්ෂයට අදාළ අ.පො.ස. (උ.පෙ )පදනම මත | 80% |
| **3.2** | අයදුම්පත් කැඳවන අධ්‍යයන වර්ෂවලට පෙර අ.පො.ස. (උ.පෙ) පදනම මත | 15% |
| **3.3** | බාහිර විභාග පාඨමාලා සඳහා සනාතන සභාවේ අනුමත වෙනත් සුදුසුකම් මත හා අ.පො.ස. (උ.පෙ) සුදුසුකම් සපුරා ඇති රාජ්‍ය සේවයේ නියුක්තිකයන් සඳහා | 5% |
| **3.4** | 3.2, 3.3, කාණ්ඩවල පුරප්පාඩු ඇති වූ විට එම පුරප්පාඩු 3.1 කාණ්ඩය යටතේ සම්පූර්ණ කළ යුතුය. | |
| **3.5** | 3.1 කාණ්ඩයේ පුරප්පාඩු ඇති වූ විට එම පුරප්පාඩු 3.2 කාණ්ඩය යටතේ සම්පූර්ණ කළ යුතුය. | |

**4. ශාස්ත්‍රවේදී උපාධිය සඳහා විෂයයන් තෝරා ගැනීමේ ක්‍රම වේදය**

| පළමු කාණ්ඩයෙන් | දෙවන කාණ්ඩයෙන් | තෙවන කාණ්ඩයෙන් | ප්‍රධාන විෂයයන් එකතුව | උපාධිය සඳහා අනිවාර්ය විෂයය ඒකක | අනිවාර්ය සේවය පදනම් කරගත් පුහුණුව |
|---|---|---|---|---|---|
| එක් විෂයයක් පමණක් | විෂයයන් 1ක් හෝ 2ක් හෝ 3ක් | විෂයයන් 1ක් හෝ 2ක් හෝ 3ක් | විෂයයන් 3ක් | ඉංග්‍රීසි විෂයය ඒකක 3ක් හා පරිගණක අධ්‍යයන විෂයය ඒකක 3ක් | පැය 300ක් |

**5. නිර්දේශිත විෂය කාණ්ඩ**

| පළමු කාණ්ඩය | දෙවන කාණ්ඩය | තෙවන කාණ්ඩය |
|---|---|---|
| සමාජවිද්‍යාව | ආර්ථික විද්‍යාව | බෞද්ධ දර්ශනය |
| මනෝවිද්‍යාව | දේශපාලන විද්‍යාව | බෞද්ධ මනෝවිද්‍යාව |
| සිංහල | භූගෝල විද්‍යාව | පාලි |
| ජනසන්නිවේදනය | පුරාවිද්‍යාව | සංස්කෘත |
| බෞද්ධ සංස්කෘතිය | මානව විද්‍යාව | හින්දි |
| | පුස්තකාල හා විඥාපන විද්‍යාව | ජර්මන් |
| | සංවර්ධන අධ්‍යයනය | රුසියන් |
| | ජාත්‍යන්තර අධ්‍යයනය | චීන |
| | සමාජසංඛ්‍යානය | ප්‍රංශ |
| | සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය | ජපන් |
| | ඉතිහාසය | ක්‍රිස්තියානි සංස්කෘතිය |
| | දර්ශනය | බටහිර සම්භාව්‍ය සංස්කෘතිය |
| | | නාට්‍ය හා රංග කලාව |
| | | ප්‍රතිබිම්භ කලා |
| | | ප්‍රාසාංගික කලා සංගීතය |
| | | ප්‍රාසංගික කලා නර්තනය |
| | | දෘශ්‍ය කලා හා සැලසුම්කරණය |
| | | වාග් විද්‍යාව |
| | | වාස්තු ශාස්ත්‍ර |
| | | සාහිත්‍ය විචාරය |

**6. විෂයයන් සඳහා සිසුන් තෝරා ගන්නා ක්‍රමවේදය**

එක් එක් විෂයන්ට සිසුන් බඳවා ගත හැකි උපරිම සීමාව අධ්‍යයන වර්ෂයකට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 25%ක් වන බැවින් මේ සඳහා අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) ලබා ඇති ඉසෙඩ් අගය (Z-Score) පදනම් කරගෙන එහි ප්‍රමුඛතාවය අනුව සිසුන් තෝරා ගැනීම සිදුකරනු ලැබේ.
එසේම එක් එක් විෂයයක් පවත්වා ගෙන යෑම සඳහා ලියාපදංචි අවම ශිෂ්‍ය සංඛ්‍යාව 20ක් විය යුතු වේ. තවද පළමු අවස්ථාවේ දී අපේක්ෂා කළ පරිදි ලියාපදිංචිය ලබා ගැනීමට නොහැකි වුවහොත් ඒ සඳහා නැවත අවස්ථාවන් ලබා දෙනු ලැබේ.

**7. විෂයයන් තෝරා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතා ඇති විෂයයන්**

පහත සඳහන් විෂයයන් හැදෑරීමට අපේක්ෂා කරන විද්‍යාර්ථීන්, එම විෂයයන්ට අදාළ ව දක්වා ඇති පූර්ව අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතුය.

| විෂය | පූර්ව අවශ්‍යතා |
|---|---|
| භූගෝල විද්‍යාව | අ.පො.ස. (උ. පෙ.) භූගෝල විෂය සමත්වීම |
| ප්‍රාසාංගික කලා නර්තනය | අ.පො.ස. (උ. පෙ.) නර්තනය විෂය සඳහා B සාමාර්ථය |
| ප්‍රාසාංගික කලා සංගීතය | අ.පො.ස. (උ. පෙ.) සංගීතය විෂය සඳහා B සාමාර්ථය |
| සමාජ සංඛ්‍යානය | අ.පො.ස. (සා. පෙ.) ගණිතය විෂය සඳහා C සාමාර්ථය |
| ප්‍රංශ /ජපන් | අ.පො.ස. (උ. පෙ.) එම විෂයයන් ගෙන් සමත්වීම හෝ නූතන භාෂා අධ්‍යයන අංශය මඟින් පවත්වන යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වීම |

**8. විෂයයන් තෝරා ගැනීම සඳහා පූර්ව අවශ්‍යතා නොමැති විෂයයන්**

අංක 7 යටතේ සඳහන් පූර්ව අවශ්‍යතා ඇති විෂයයන් හැර අංක 5 යටතේ ඇති සෑම විෂයය ඒකකයක් ම පූර්ව අවශ්‍යතා නොමැතිව අපේක්ෂකයාගේ රුචිකත්වය මත තෝරා ගැනීමට අවස්ථාව සලසා දී ඇත.

**9. අනිවාර්යයෙන්ම තෝරාගත යුතු වෘත්තීය අභිමුඛ පාඨමාලා ඒකක**

**9.1 ඉංග්‍රීසි භාෂාව**

| උපාධි මට්ටම | පාඨමාලා ඒකක කේතය | වර්ගය | විෂය ධාරාව |
|---|---|---|---|
| 1 ස්තරය | CBEN 18213 | Compulsory | English for Humanities and Social Sciences |
| 2 ස්තරය | CBEN 28223 | Compulsory | English for Today's World |
| 3 ස්තරය | CBEN 38233 | Compulsory | English for Professional Purposes |

**9.2 තොරතුරු තාක්ෂණය**

| උපාධි මට්ටම | පාඨමාලා ඒකක කේතය | වර්ගය | විෂයධාරාව |
|---|---|---|---|
| 1 ස්තරය | CBI T 18213 | Compulsory | Fundamentals of ICT |
| 2 ස්තරය | CBI T 28223 | Compulsory | MS-Office Applications for Workplace |
| 3 ස්තරය | CBI T 38233 | Compulsory | Cloud Computing in Everyday Life |

**10. සේවය පදනම් කරගත් පුහුණු වැඩ සටහන**

ලියාපදිංචි සෑම අපේක්ෂකයෙකු විසින්ම උපාධිය අවසන් වීමට පෙර කැලණිය විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය විසින් ලබා දෙන මාර්ගෝපදේශවලට අනුව සේවය පදනම් කරගත් පුහුණු පැය 300ක් සම්පූර්ණ කොට තිබීම උපාධිය සමත්වීම සඳහා අනිවාර්ය වේ.

| උපාධි මට්ටම | පාඨමාලා ඒකක කේතය | වර්ගය | විෂයධාරාව |
|---|---|---|---|
| 3 ස්තරය | CBWT 38213 | Compulsory | Work-based training |

**11. ශාස්ත්‍රවේදී උපාධි බාහිර පාඨමාලාවට අදාල සම්භාර ප්‍රමාණය සකස් වන ආකාරය**

එක් ස්තරයක දී අධ්‍යයන සම්භාර 30 බැගින් ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාවේ ස්තර තුන සඳහා අවම වශයෙන් අධ්‍යයන සම්භාර 90 ක් පහත සඳහන් පරිදි සම්පූර්ණ කළ යුතු වේ. යම් අපේක්ෂකයෙකුට අවශ්‍ය නම් එක් ස්තරයක දී උපරිම වශයෙන් අධ්‍යයන සම්භාර 36 ක් සඳහා ලියාපදිංචි විය හැක.

| උපාධි මට්ටම ස්තරය/වසර | ප්‍රධාන විෂයයන් තුනකි | ප්‍රධාන විෂයයන්හි අධ්‍යයන සම්භාර ප්‍රමාණය | වෘත්තීය අභිමුඛ පාඨමාලා දෙකකි | වෘත්තීය අභිමුඛ පාඨමාලාවන්හි අධ්‍යයන සම්භාර ප්‍රමාණය | වසරක අධ්‍යයන සම්භාර ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| පළමු ස්තරය | 3 | 3×8 =24 | 2 | 2×3 =6 | 30 |
| දෙවන ස්තරය | 3 | 3×8 =24 | 2 | 2×3 =6 | 30 |
| තෙවන ස්තරය | 3 | 3×8 =24 | 2 | 2×3 =6 | 30 |
| **වසර තුනට සම්භාර එකතුව** | | **72** | | **18** | **90** |